සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: බෞද්ධ ශිෂ්ටාචාරය I | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 2 |

උපදෙස්:

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර යටින් ඉරි අඳින්න.

01. බ්‍රාහ්මණයන් වර්ණ පදනම් කොට ගෙන සමාජය කොටස් හතරකට බෙදයි. ඒ වර්ග කිරීම නිර්මාණවාදී බෙදීමක් ලෙස සඳහන් කර තිබේ. ඍග්වේදයේ 10 වන මණ්ඩලයේ 90 වන පුරුෂ සූක්තය මගින් ද ඒ බව කියවේ. එම තොරතුරුවලට අනුව බ්‍රාහ්මණයින් විසින් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර වශයෙන් සංස්ථාවන් හතරකට මුලු මහත් භාරතීය සමාජය ම බෙදා ඇත. එම බෙදීම ඔවුන් විසින් සිදුකරන ලද්දේ.

1) සමාජය පදනම් කොට ගෙනය
2) ශරීරය පදනම් කොට ගෙනය
3) පරිසරය පදනම් කොට ගෙනය
4) ගුණ ධර්ම භේදය පදනම් කොට ගෙනය
5) උස් පහත් භේදය පදනම් කොට ගෙනය

02. වෛදික සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් ආකාරයට බ්‍රාහ්මණ වර්ණයට අයත් **නොවන** ස්වධර්ම ඇතුළත් වර්ණය වනුයේ මෙයින් කුමණ වර්ණයෙහිද?

1. අධ්‍යාපනය, යාග කිරීම, යාග කරවීම
2. අධ්‍යාපනය, දන්දීම, රාජ්‍යානුශාසනය
3. අධ්‍යාපනය, අධ්‍යයනය, යාග කිරීම
4. අධ්‍යාපනය, යාග කිරීම,කෘෂිකර්මාන්තය
5. අධ්‍යාපනය, යාග කරවීම, රාජ්‍යානුශාසනය

03. බ්‍රාහ්මණ ඉගැන්වීම් මගින් කාන්තාව විවිධ වූ නීති රීති වලට යටත් කොට පාලනය කරන ලදි. ඇය සිය ජීවිත කාලය පුරාවට ස්වාමියාට පති භක්තියෙන් යුතුව චාරිත්‍ර වාරිත්‍ර ද ඉටුකළ යුතු ය. ඒ අනුව බිරිද තම ස්වාමියා වෙනුවෙන් ඉටුකළ යුතු උසස්ම චාරිත්‍රය වන්නේ.

1. ස්වාමියාගේ දෙමවුපියන් හොඳින් රැකබලා ගැනීමයි.
2. දරුවන්ගේ හා නිවසේ කටයුතු සියල්ල මැනවින් ඉටු කිරීමයි.
3. ස්වාමි පුරුෂයාට නො අඩුව සිය සිතැඟි ඉටු කර ගැනීමට ඉඩ දීමයි.
4. ස්වාමි පුරුෂයා මියගිය පසු වැඩිමහල් පුතු යටතේ විවාහක ජීවිතයක් ගත කිරීමයි.
5. ස්වාමි පුරුෂයා මළ පසු සති පූජාව පැවැත්වීමයි.

04. බුද්ධකාලීන ප්‍රකට ශාස්තෘවරයකු වූ පූර්ණකස්සපගේ ප්‍රධාන ඉගැන්වීම වන්නේ.

1. උච්ඡේද භෞතිකවාදයයි 2. පරම අවිහිංසාවාදයයි 3. අමරා වික්ඛේපවාදයයි
4. අකිරියවාදයයි 5. නියති පරිණාමවාදයයි

05. බුද්ධකාලීන භාරතයේ පැවැති සොළොස් මහා ජනපද අතුරෙන් රාජාණ්ඩු ප්‍රතිපත්ති ක්‍රියාත්මක **නොවුන** ජනපදය ලෙස සැලකෙන්නේ

1. මගධ ජනපදයයි 2. කෝසල ජනපදයයි 3. වත්ස ජනපදයයි
4. අවන්ති ජනපදයයි 5. වජ්ජි ජනපදයයි

06. භාරතය තුළ වාණිජකරණය ජාත්‍යන්තර වශයෙන් දියුණු තත්ත්වයකට පත්ව තිබුණු බවට දැක්විය හැකි සාධකය වන්නේ.

1. භාණ්ඩ නිෂ්පාදනය කිරීම ඉහළ යෑමයි. 2. නගර නිර්මාණය වීමයි.
3. සේද මාවත් ඔස්සේ කළ වෙළදාමයි. 4. ගංගා මිටියාවත් ඔස්සේ භාණ්ඩ වෙළදාමයි
5. කෘෂි නිෂ්පාදනවලින් ස්වයංපෝෂණය වීමයි.

07. දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික සම්පරායික යන උභයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා කරන බැවින් ද දෙව් මිනිසුන්ට ශාස්තෘවරයා මෙන් ම ගුරුවරයා වන බැවින් ද, බුදු රජාණන් වහන්සේ සුවිශේෂ නාමයකින් හඳුන්වන බව නව අරහාදි බුදුගුණ විවරණයෙන් පැහැදිලි වේ. එම බුදුගුණය හැඳින්වෙන්නේ.

1. ලෝකවිදූ නම්නි. 2. අරහං නම්නි. 3. සත්ථාදේවමනුස්සානං නම්නි.
4. භගවා නම්නි. 5. සම්මාසම්බුද්ධ නම්නි.

08. "මිනිස් වර්ගයාගේ වැඩි ම සංඛ්‍යාවකින් පූජා ලද තැනැත්තා ලෙස ඉතා පහසුවෙන් ම වෙන් කොට දැක්විය හැක්කේ බුදු රජාණන් වහන්සේ ය." බුදුරජාණන් වහන්සේ පිළිබඳ නූතන ඇගයීමක් වන මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

1. මහාචාර්ය ලක්ෂ්මි නරසු. 2. ඇල්බට් අයින්ස්ටයින් 3. බර්ට්‍රන්ඩ් රසල්
4. මහාචාර්ය සෝණ්ඩර්ස්. 5. එඩ්වින් ආර්නෝල්ඩ්

09. මගධය වේභාර,වේපුල්ල,ගිජ්ඣකූට,ඉසිගිලි,පාණ්ඩව යන පර්වත පහකින්ම වට වී පිහිටා ඇති මහා රාජ්‍යයකි. මුල්කාලීනව මෙහි පාලකයා බිම්බිසාර රජුවේ. ඒ අනුව පර්වත පහකින් වට වූ නිසා මෙම රාජ්‍ය හඳුන්වනු ලැබුවේ.

1) ගිරිබ්බජ නමින් ය 2) ගිරිපර්වත නමින් ය 3) පඤ්ච පර්වත නමින් ය
4) මහාමේරු පර්වත නමින් ය 5) පඤ්චකූට පබ්බත නමින් ය

10. බුදුන්වහන්සේ විවිධ වූ දක්ෂතා හැකියා ඇති මහතෙරුන්ට මෙන්ම තෙරණිවරුන්ට ද තනතුරු පිරිනමන ලදි. ඒ අතරින් පැරණි භික්ෂුණීන් අතර අග්‍ර පදවිය ප්‍රධානය කරනු ලැබුවේ.

1. ඛේමා තෙරණිය ට. 2. මහා ප්‍රජාපතීගෝතමී තෙරණියට.
3. සෝමා තෙරණිය ට. 4. සකුලා තෙරුණියට. 5.භද්දකච්චායනා තෙරණියට

11. බුදුදහමට අනුව යම් පුද්ගලයෙක් උපාසකයෙකු බවට පත්වන්නට නම් තිසරණ සහිත වූ පන්චසීලය සමාදන්ව ආරක්ෂා කළ යුතුවේ. ධර්මය ශ්‍රවනය කළ යුතුය. දාන, සීල, භාවනා යන ත්‍රිවිධ කුසලයන්තුළ නොපැකිළිව කටයුතු කළ යුතුවේ. ඒ අනුව බුද්ධ කාලීන උපාසකවරුන් අතර බුද්ධ යන නාමය ශ්‍රවනය කිරීමත් සමඟ බුදුන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරගත් උපාසකතුමා වන්නේ.

1. චිත්ත ගහපති තුමා ය. 2. අනාථපිණ්ඩික තුමාය. 3. නකුල පිතාය.
4. ධනංජය සිටුතුමාය 5. උපාලි ගෘහපතියාය.

12. පුද්ගලාබද්ධ කර්මයන්ගේ අයිතිය කරන්නාට හිමි වන බව බුදු දහම මගින් උගන්වන අතර බමුණු දහම සියලු කර්මයන්ගේ අයිතිය අදෘශ්‍යමාන බලකයට පවරා ඇත. විශ්වයේ ආරම්භය, සත්වයාගේ ඇවැත්ම පැවැත්ම සර්වබලධාරී දෙවියකුට පවරා ඇති අයුරු බමුණු දර්ශනයන්ගේ ඉගැන්වීම් මගින් දක්නට ලැබුණි. එම ඉගැන්වීම් හේතුවෙන් පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව අහිමි වේ. එහි එන ස්වාමිත්වයෙන් අදහස් කරන්නේ.

1. තමාට තමා හැර වෙනත් අයෙකු නැතිබවය
2. නිදහස්ව සිය කැමැත්ත පරිදි කටයුතු කළ හැකි බවය
3. සිය කැමැත්තට අනුව හොඳ නරක තමා විසින්ම තීරණය කිරීමය
4. තමාත් අනුනුත් එක හා සමාන බවය
5. තමා තමාට අවංක විය යුතු බවය

13. සමාජ ප්‍රභවය පිළිබඳ විවිධ අදහස් භාරතයේ පැවති දර්ශනවාදවලින් උගන්වා ඇත. නිර්මාණ වාදී ඉගැන්වීම් ඒ අතර දක්නට ලැබුණි. එහෙත් සමාජ ප්‍රභවය සිදු වී ඇත්තේ කිසිවකුගේ හෝ මැවීමක් පදනම් කොට ගෙන නොවන බව බුදුදහම අවධාරණය කර ඇත. ඒ සඳහා භාවිතා කළ ඉගැන්වීම වූයේ.

1. ත්‍රිලක්ෂණවාදය යි. 2. හේතුඵලවාදයයි. 3.නියාමධර්ම සංකල්පයයි.
4. චතුරාර්ය සත්‍යයයි. 5. භාවනා සංකල්පයයි.

14. බෞද්ධ දේශපාලන දර්ශනයට අනුව රටේ රජතුමා විසින් තම රාජ්‍ය තුළ සිටින වෙළඳාමේ නිරත වන පිරිස් හඳුනාගෙන ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතුවල අභිවෘද්ධිය උදෙසා අවශ්‍ය මූල්‍ය ධනය සපයා දීම, රජයට සේවය කරන පිරිස් වෙනුවෙන් ආහාරපාන හා වටුප් ලබා දීම, යනුවෙන් දැක්වෙන පරිදි රට තුළ රැකියා අවස්ථා සැලසුම් කිරීම තුළින් රටේ දිළිඳුකම තුරන් කර ගත හැකි බව සඳහන් රාජ ධර්මය වන්නේ.

1. අවිහිංසාව යි 2. අක්‍රෝධය යි 3. දානය යි 4. අවිරෝධතාවය යි
5. සීලය යි

15. දස සක්විතිවත් පිළිබඳ බෞද්ධ ඉගැන්වීමට අනුව සක්විති රජකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙතට ඇතුළත් **නොවන** ලක්ෂණය වන්නේ.

1. අන්තඃපුර ජනයා කෙරෙහි ආරක්ෂාව සංවිධානය කළ යුතුය යන්න යි.
2. බල සේනාව කෙරෙහි ආරක්ෂාව සංවිධානය කළ යුතුය යන්න යි.
3. බ්‍රාහ්මණ ගෘහපතීන් කෙරෙහි ආරක්ෂාව සංවිධානය කළ යුතුය යන්න යි.
4. විවාහක අවිවාහක ස්ත්‍රීන් කෙරෙහි ආරක්ෂාව සංවිධානය කළ යුතුය යන්න යි.
5. ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි ආරක්ෂාව සංවිධානය කළ යුතුය යන්න යි.

16. සිත,කය,වචනය යන තිදොරින් සිදුවන නිරවද්‍ය ක්‍රියා දහයක් ඇති බවත්, ඒවා දස කුසල් නමින් හැඳින්වෙන බවත් බුදුදහමේ දැක්වේ. මෙම කුසල දහය සිදු වන්නේ.

1. කයින් තුනක් ද වචනයෙන් තුනක් ද මනසින් හතරක් වශයෙනි.
2. කයින් හතරක් ද වචනයෙන් තුනක් ද මනසින් තුනක් වශයෙනි.
3. කයින් තුනක් ද වචනයෙන් හතරක් ද මනසින් දෙකක් වශයෙනි.
4. කයින් හතරක් ද,වචනයෙන් හතරක් ද, මනසින් දෙකක් වශයෙනි.
5. කයින් හතරක් ද, වචනයෙන් දෙකක් ද, මනසින් හතරක් වශයෙනි.

17. දස පුණ්‍ය ක්‍රියාවල ඇතුළත් පිං අනුමෝදන් කිරීම.............................. යනුවෙන් හඳින්වේ.

1. වෙය්‍යාවච්ච 2. අපචායන 3. පත්තිදාන 4. උපට්ඨාන 5. පත්තානුමෝදනා

18. දස අකුසලයෙන් මිදීම දස කුසලයයි. ඒ අනුව දස කුසලයට අයත් වන්නේ.

1. ප්‍රාණඝාතයෙන් වැළකීම. 2. සොරකම් කිරීම 3. කාමයේ හැසිරීම 4. බොරු කීම
5. කේලාම් කීම

19. විනය ශික්ෂාවන්ට අනුව භික්ෂූන්ට නිල් තණ පිට්ටනිවල මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම, ජලයට මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම තහනම් විය. එසේම සියලුම ආකාරයේ පැළ වන බීජ සිඳීම භික්ෂූන්ට ආපත්තියක් විය. මේ ඉගැන්වීම් තුළින් ප්‍රකාශ වන්නේ.

1. භික්ෂූන්ට බුදුන්වහන්සේ පරිසරය සම්බන්ධව විනයනීති පනවන ආකාරයයි
2. පරිසරය සංරක්ෂණයේ දී භික්ෂුවගේ දායකත්වයයි.
3. රජයේ ප්‍රතිපත්ති භික්ෂුව රැකියයුතු බවයි.
4. පරිසරය විනාශයෙන් රෝගාදිය ඇති වන බවයි.
5. ජලයට මුත්‍රා කිරීම නිසා ජලය අපිරිසිදුවන බවයි.

20. සෞන්දර්ය රසාස්වාදය බුදුදහම තුළ අවතක්සේරු කොට නොමැත. බුදුරදුන් පවා ඇතැම් අවස්ථාවන්හිදී විරාගී රස වින්දනය අගය කොට ඇත. එලෙස බුදුරදුන් සෞන්දර්ය අගය කළ අවස්ථාවක් දැක්වෙන මූලාශ්‍රයක් වන්නේ.

1. ඒතදග්ග පාලියයි 2. ථෙර ථෙරී ගාථා ආදියයි 3. සක්කපඤ්හ සූත්‍රයයි
4. වනරෝපම සූත්‍රයයි 5. චක්කවත්තිසීහනාද සූත්‍රයයි.

21. ධනය පසුපස යාමත්, ධන සම්පත් ජීවිතයේ නිශ්ඨාව ලෙස නොසැලකීමත්, සම්පත් ගොඩගසා නොගෙන පරිභරණයට ඉඩ හැරීමත් කළ යුතු බව බුද්ධ දේශනාවයි. ඒ අනුව සම්පත් පරිභරණයේ දී අනුගමනය කල යුතු ක්‍රමවේදය සඳහන් වන බෞද්ධ ඉගැන්වීම වන්නේ.

1. පංචබලි සංකල්පයයි. 2. කර්ම සංකල්පයයි. 3. චතුර්විධ සැප සංකල්පයයි.
4. චතුර්විධ සංකල්පයයි. 5. සම්මා ආජීවයයි.

22. ධනය ඉපැයීමේ දී ශ්‍රමය වැය කිරීම අනිවාර්ය බැවින් අනලස්ව, උත්සාහයෙන් හා වීර්යයෙන් ක්‍රියා කළ යුතුය. පුද්ගලයා තම ශ්‍රමය උත්සාහය යොදා පවත්වාගත යුතු අවස්ථා කිහිපයක් පෙන්වා දෙන බුදුදහම ආරම්භ කරන ලද කාර්යය නොනවත්වා ඉදිරියට පවත්වාගෙන යෑම හඳුන්වන්නේ.

1. ආරම්භක ධාතු ලෙසය 2. නික්ඛම ධාතු ලෙසය 3. පරක්කම ධාතු ලෙසය
4. ථාම ධාතු ලෙසය 5. ඨිති ධාතු ලෙසය

23. බුදුදහමට අනුව නොකළයුතු වෙළදාම් මෙන්ම තුලාකූට, කංසකූට, මානකූට, උක්කෝටන, නිකති ආදී විවිධ වාංචනික කටයුතුවලින් මුදල් ඉපයීම නොකළ යුතු යැයි දේශනා කොට ඇත. එයින් උක්කෝටන ලෙස හඳුන්වන්නේ.

1. හොර තරාදිවලින් කරන මැනීම 2. රැවටීම් මගින් කරන වැඩ
3. හොර පඩිවලින් කරන මැනීම 4. හොරට මැනීමෙන් කරන වැඩ
5. අල්ලස් ගැනීමෙන් කරන මැනීම්

24. ආර්ය විනයෙහි දකුණු දිශාවට නමස්කාර කිරීම යනුවෙන් හඳුන්වා ඇත්තේ.......................විෂයෙහි යුතුකම් හා ගකිම් ඉටු කිරීමයි.

1. දෙමාපියන් 2. අඹු-දරුවන් 3. යහළු මිත්‍රයන් 4. ගුරුවරුන්

5. සේවක-සේවිකාවන්

25. පුද්ගලයකුගේ මෙලොව වශයෙන් දියුණුවක් ඇති කර ගැනීමට වැදගත් සූත්‍ර දේශනාවක් වශයෙන් මංගල කරුණු දේශනා කොට ඇත. එහි ඇතුළත් කරුණු සංඛ්‍යාව වුයේ.

1. විසිහතර කි. 2. විසිපහ කි. 3. විසිහයකි. 4. විසිහතකි. 5 .විසිඅටකි

26. ධනය, තනතුරු ආදිය පිළිබඳ මානයෙන් තද වී ස්වකීය ඥාතීන් පහත් කොට සැළකීම මූලාශ්‍රයාගත තොරතුරුවලට අනුව පුද්ගලයා

1. භෝග විනාශ කරන්නෙක් වෙයි. 2. තෘෂ්ණාවෙන් පෙළෙන්නෙක් වෙයි.

3. පසුතැවීමට පත් වෙයි. 4. පරිහීමට පත්වෙයි.

5. නිදි වර්ජිතව කටයුතු කරන්නෙක් වෙයි.

27. "අක්කෝධේන ජිනේ කෝධං-අසාධුං සාධුනා ජිනේ

ජිනේ කදරියං දානේන-සච්චේන අලිකවාදිනං'

ඉහත ගාථාවට අනුව ක්‍රෝධ කරන්නා ඒකාන්තයෙන්ම දිනිය යුතු වන්නේ

1. මෛත්‍රී කිරීමෙන් ය. 2. සත්පුරුෂ කමින්ය. 3. දන් දීමෙන් ය.

4. සත්‍ය කතා කිරීමෙන් ය. 5. බණ ඇසීමෙන් ය.

28. බුද්ධත්වයෙන් පසු තමා විසින් අවබෝධ කොටගත් ධර්මය ලෝකයාට දේශනා කිරීමේ අපේක්ෂාවෙන් බරණැස ඉසිපතනාරාමයට වැඩම කළ බුදුන් වහන්සේ ප්‍රථම රහත් හැටනම ධර්ම ප්‍රචාරයේ යොදවා උන්වහන්සේ ද ධර්ම ප්‍රචාරයේ යෙදුනසේක. එහිදි දෙවන ධර්ම දූත කණ්ඩායම ද ධර්ම ප්‍රචාරයේ යෙදවීමට බුදුන් වහන්සේට හැකියාව ලැබී ඇත. ඒ අනුව සසුනට එක් වූ දෙවන කණ්ඩායම වන්නේ.

1. යසකුල පුත්‍රයා ඇතුලු කණ්ඩායමයි. 2. පස්වග මහණුන් ය.

3. භද්දවග්ගිය කුමාරවරුන් ය. 4. තුන් බෑ ජටිලයින් ය.

5. කාළුදායි ඇතුලු පිරිසයි.

29. බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් යෑමට මත්තෙන් ශාසනයේ ඇති වූ අධර්මාදී ක්‍රියාවන් හේතුවෙන් මහ තෙරුන් විසින් සංගායනාවක් පැවැත් වීමට තීරණය කර ඇත. එසේ ගන්නා ලද තීරණයට අනුව පළමු සංගායනාව පැවැත්වීමට සියලු කටයුතු මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සූදානම් කළ අතර එහි දී මුලින්ම සංගායනා කිරීමට තීරණය කරන ලද්දේ.

1. සුභද්‍ර තෙරුන්ගේ ප්‍රකාශනය සාකච්ඡා කිරීමයි

2. ධර්මය පිළිබඳ ආනන්ද හිමිගෙන් ප්‍රශ්න කිරීමයි.

3. විනය පිළිබඳ උපාලි තෙරුන්ගෙන් විමසීමයි.

4. ආනන්ද හිමිට නැගුණ චෝදනාවන්ගෙන් උන්වහන්සේ නිදහස් කිරීමයි.

5. කුඩා අනුකුඩා ශික්ෂා පද පිළිබඳවයි.

30. දෙවන ධර්ම සංගායනාව සඳහා ප්‍රධාන වූයේ වජ්ජි පුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත් කරන ලද දස වස්තුව වේ. එහි එන **ආවාස කප්ප** ලෙස සඳහන් වන්නේ.

1. අඟක ලුණු තබාගෙන භාවිතය කැප ය.
2. දෑඟුලක් ඉර අවරට ගිය කල වැළඳීම කැප ය.
3. එකම ආවාසයක පිරිස වෙන වෙනම විනය කර්ම කිරීම කැපය.
4. කිරිත්, දීකිරිත් නොවූ මැද මට්ටමේ කිරි වැළඳීම කැපය.
5. නොපැසුණු සුරා පානය කිරීම කැපය.

31. දස වස්තුව විනිශ්චය කිරීමට මුලින් ම උබ්බාහිකාවක් පත් කළ අතර එහි දී පෙරදිගින් හා බටහිර දිසාවෙන් භික්ෂූන් හතර නම බැගින් අටනමක් වැඩමවන ලදි. එයින් පෙරදිගින් වැඩමවන ලද්දේ.

1. සබ්බකාමී, සාළ්හ, ඛුජ්ජසෝභිත, වාසභගාමී යන හිමිවරුන් ය.
2. රේවත, සානවාසීසාම්භූත, කාකණ්ඩපුත්‍ර යස, සුමන යන හිමිවරුන් ය.
3. සබ්බකාමී, සානවාසීසාම්භූත, වාසභගාමී, සුමන යන හිමිවරුන් ය.
4. රේවත, සාළ්හ, ඛුජ්ජසෝභිත, සබ්බකාමී යන හිමිවරුන් ය.
5. සබ්බකාමී, සාළ්හ, ඛුජ්ජසෝභිත, රේවත යන හිමිවරුන් ය.

32. භාරතයේ පැවති බෞද්ධ විශ්වවිද්‍යාල අතරින් **අතීස හිමියන්ගේ** ප්‍රධානත්වයෙන් සියලු කටයුතු සිදු වූ විශ්වවිද්‍යාලය වූයේ.

1. නාලන්දා විශ්වවිද්‍යාලයයි.
2. වික්‍රමශිලා විශ්විද්‍යාලයයි
3. වලභි විශ්වවිද්‍යාලයයි
4. සෝමපුර විශ්වවිද්‍යාලයයි.
5. ජගන්දලා විශ්වවිද්‍යාලයයි.

33. භාරතයේ පහළ වූ අසහාය බෞද්ධ පාලකයෙකු බවට අශෝක රජු පසුකාලයේ දී පත් වී ඇත. එතුමා බෞද්ධ ප්‍රබෝදය වෙනුවෙන් විශාල සේවයක් සිදු කරන ලදි. සංඝ සාමග්‍රියක් ඇති කිරීම, සංගායනාවක් පැවැත්වීම මෙන්ම වෙහෙර විහාරද ඉදි කර තිබේ. මෙම සියලු සත්කාර්යයන් ඉටු කළ අසෝක රජු බෞද්ධයකු බවට පත් වන්නේ.

1. නිග්‍රෝධ සාමනේරයානන් වහන්සේ මගින් ය.
2. මොග්ගලිපුත්ත තිස්ස හිමියන් මගින් ය.
3. මහාකාශ්‍යප හිමියන් මගින් ය.
4. සැරියුත් හිමියන් මගින් ය.
5. ආනන්ද හිමියන් මගින් ය.

34. පණ්ඩුකාභය රජු යක්ෂයින්ට විවිධ ස්ථානවල වාසස්ථාන ඉදිකර දෙන ලදි. ඒ අනුව කාලවේල යක්ෂයාට දෙවොලක් ඉදි කර දෙන ලද්දේ.

1. අභය වැවේ යටි කොනෙන් ය.
2. රජ මැදුර ආසන්නයේ ය.
3. නුවරින් නැගෙනහිර දිසාවෙන් ය.
4. කලා වැව ආසන්නයේ ය.
5. තිසා වැවේ උඩ කොනින් ය.

35. මෙලොව දී යම් පවුලකට කුලයකට හිතවත්ව සිටිය අය මියගිය පසු යක්ෂ ආත්මවල ඉපදී පෙර ආත්මයේ නෑදෑ හිතමිතුරන් රැකබලාගන්නේ යැයි විශ්වාසයෙන් ඔවුන් මළවුන් ඇදහීමක් සිදු කරන ලදි. එම ක්‍රමය බුදු දහම ලැබීමෙන් පසුව

1. වෘක්ෂ වන්දනාවට ආදේශ විය.
2. දේව වන්දනාවට අදේශ විය.
3. ස්තූප වන්දනාවට අදේශ විය.
4. මළවුන්ට පින්දීමට ආදේශ විය.
5. ප්‍රතිමාවන්දනයට ආදේශ විය.

36. බුදුදහම පැමිණෙන්නට පෙර ලක්දිව බොහෝ ආගමික ඇදහිලි හා විශ්වාස පැවතිණ. එම ඇදහිලි හා විශ්වාසයන්ට අනුග්‍රහ දැක් වූ රජෙකු ලෙස පණ්ඩුකාභය රජු හඳුනාගත හැකිය. රජු ආගමික කටයුතු ඉටු කිරීමට පහසුකම් සපයා දීමක් ලෙස 'සොත්ථි ශාලා' නම් ගොඩනැගිලි විශේෂයක් කරවා දුන් බව මහා වංශයේ සඳහන් වේ. එම ගොඩනැගිලි විශේෂය තනවා දෙන ලද්දේ.

1. බ්‍රාහ්මණයින් උදෙසාය. 2. පරිබ්‍රාජකයින් උදෙසා ය 3. නිගණ්ටයින් උදෙසා ය
4. ආජීවකයන් උදෙසා ය. 5. තාපසයන් උදෙසා ය.

37. ශ්‍රී ලංකාවේ ඉපැරණි බෞද්ධ මධ්‍යස්ථාන මගින් ඉටු වූ ශාසනික කාර්යභාරය අතිමහත් ය. ඒ අනුව ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, පාලි අටුවා රචනා කිරීම, විනය සංගායනාවක් පැවැත් වීම ආදී ධර්ම ශාස්ත්‍රිය සේවාවන් ඉටු කරන ලද්දේ.

1. අභයගිරි විහාරයේ මූලිකත්වයෙන් ය.
2. මහා විහාරයේ මූලිකත්වයෙන් ය.
3. ජේතවන විහාරයේ මූලිකත්වයෙන් ය.
4. චේතිගිරි විහරයේ මූලිකත්වයෙන් ය.
5. වෙස්සගිරි විහාරයේ මූලිකත්වයෙන් ය.

38. ලාංකේය රාෂ්ට්‍ර පාලනපයට බුදුදහමේ ආභාෂය ලැබී ඇති ආකරය විවිධ සාධකයන්ගෙන් හඳුනාගත හැකිය. ඒ අතර වැදගත් ලක්ණයක් වන්නේ ලාංකේය පාලකයින්ට අනුශාසනා කිරීමට භික්ෂූන් මූලික වීම යි එහි දී දුටුගැමුණු රජුට අනුශාසනා කරන ලද්දේ.

1. මිහිඳු මහ රහතන් වහන්සේ ය.
2. ගෝධගත්තතිස්ස හිමියන් ය.
3. කුපික්කල තිස්ස හිමියන් ය.
4. මලිය දේව හිමියන් ය.
5. අරිට්ඨ තෙරුන් ය.

39. 'මාගේ මේ ව්‍යායාමය කිසි කලෙකත් රජසැප පිනිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාය' යන සටන් පාඨය ඉදිරිපත් කල රජතුමා වන්නේ.

1. වළගම්බා රජතුමා ය.
2. දුටුගැමුණු රජතුමා ය.
3. එළාර රජතුමා ය.
4. මහසෙන් රජතුමා ය.
5. දේවානම් පිය තිස්ස රජතුමා ය

40. ථෙරවාදී පාලි ත්‍රිපිටකය ආරක්ෂා කොට පවත්වා ගැනීමෙහි ලා බුරුම රජවරුන්ගෙන් සිදු වූ මෙහෙය ප්‍රසංසාර්හය. ප්‍රකට බුරුම බෞද්ධ රජ දරුවන් අතර අනෞරථ රජු කල වැදගත් ශාසනික ධර්ම ශාස්ත්‍රීය සේවාවක් වන්නේ.

1. ත්‍රිපිටකය බුරුම අක්ෂරවලින් ලියවා තැබීම වේ.
2. ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වීම වේ.
3. බෞද්ධ විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීම වේ
4. ත්‍රිපිටකය කිරිගරුඬ පුවරුවල ලිවීම වේ
5. ස්වේදගොන් චෛත්‍යය නිර්මාණය වේ.

41. ථායි දේශයට බුදු සමයේ ආභාසය නිසා හිමි වූ දායාදයන් ලෙස බෞද්ධ උත්සව කලාව දැක්විය හැකිය. මේ අනුව ථායිලන්තයේ වාර්ෂිකව පැවැත්වෙන විවිද බෞද්ධ උත්සව අතර ථායි රජතුමා අනිවාර්යෙන්ම සහභාගි විය යුතු උත්සවය වන්නේ

1. වෙසක් උත්සවයයි
2. කඨින උත්සවයයි
3. ඇසළ උත්සවයයි.
4. අලුත් අවුරුදු උත්සවයි.
5. මළවුන් පිදීමේ උත්සවයයි.

42. ථායිලන්තයේ මුල්කාලීනව පැවති සියම් නිකාය පසු කාලයේ දී මහා නිකාය හා ධම්මයුක්තික නිකාය වශයෙන් දෙකොටසකට බෙදන ලද්දේ

1 සූර්යවංශ රජුගේ කාලයේ ය.
2. අහවරථ රාජ්‍ය සමයේ ය.
3. කෙයංසිත්ත රාජ්‍ය සමයේ ය.
4. මොන්කුත් රාජ්‍ය සමයේ ය.
5. බෝදෝපයා රාජ්‍ය සමයේ ය.

43. චීන බෞද්ධ ඉතිහාසයේ පිළිගැනීමට අනුව එරටට බුදුදහම පළමුවරට හඳුන්වා දීම සිදු වූයේ හැංමිංදි රාජ්‍ය සමයේ ය දීය. එහි පුරෝගාමීව කටයුතු කරන ලද්දේ.

1. කාශ්‍යප මාතාංග හා ධර්මාකර හිමිවරුන් ය.
2. කාශ්‍යප මාතාංග හා සංඝපාල හිමිවරුන් ය.
3. කාශයප මාතාංග හා කුමාරජීව හිමිවරුන් ය.
4. කාශයප මාතාංග හා ශාන්තරක්ෂිත හිමිවරුන් ය.
5. කාශ්‍යප මාතාංග හා ධර්මරක්ෂ හිමිවරුන් ය.

44. ජපානයට බුදුදහම පැමිණිමට පෙරාතුව එහි පැවතියේ ස්වභාවධර්මයේ කල්පිත දෙවිවරුන් හා මළවුන් ඇදහීම මුල් කරගත් වන්දනා ක්‍රමයකි. එම වන්දනා ක්‍රමය හඳුන්වන්නේ.

1. සෙන් සම්ප්‍රදාය වශයෙනි.
2. කොම්පියුසියස් දහම නමින්ය.
3. ෂින්තෝ ආගම නමින් ය.
4. තාඕ දහම නමින් ය.
5. කිස්තු දහම නමින් ය.

45. වගන්ති 17 කින් සමන්විත ව්‍යවස්ථාවක් මගින් බුදුදහම රාජ්‍ය ආගම බවට පත් කළ ජපන් බෞද්ධ පාලකයා වන්නේ.

1. සුයිකෝ අධිරිජිණියයි 2. ක්වම්මු අධිරාජයාය. 3. සෝගාණෝ ඉනමේ අධිරාජ්‍යායාය.
4. කිම්මෙයි අධිරාජ්‍යාය 5. ෂෝතොකුතයිෂි අධිරාජයාය.

46. සෙන් බුදුදහමේ ආභාසයෙන් ගොඩනැගුණ ජපන් සංස්කෘතිය තුළ විශේෂ කලා සම්ප්‍රදායන් ඇති විය. ඒ සම්ප්‍රදායන් අතරින් **නෝ කබුකි** ලෙස හඳුන්වන්නේ

1. ඔකුම් නාට්‍ය කලාවයි. 2. මල්සැකසුම් කලාවයි. 3. චිත්‍ර කලාවයි.
4. ගීත කලාවයි. 5. තේපානෝත්සවයයි.

47. බෞද්ධ කලා සම්ප්‍රදායේ ශ්‍රේෂ්ඨ නිර්මාණයක් ලෙස සැලකෙන බුද්ධ ප්‍රතිමාව උද්දේශික චෛත්‍යයට ඇතුළත් වේ. එම නිර්මාණය මුල් කාලයේ දී සිදු කිරීමට කලා කරුවා පෙළඹී නැත. ඊට ප්‍රධානතම හේතුව උතුම් ගෞරවය බව දක්වා ඇත. ඒ අනුව බුදුන් වහන්සේ **අප්පටිභාගෝ** වශයෙන් හඳුන්වා තිබේ. එයින් ප්‍රකාශ වන්නේ.

1. අද්වතීය ය නම් වේ. 2. අසහාය නම් වේ. 3 අප්‍රතිභාග නම් වේ.
4. අරහත් නම් වේ. 5. අසමසම නම් වේ.

48. වීරාසනයෙන් හෝ පද්මාසනයෙන් හෝ හිඳ උකුළ මත විවෘත කළ වම් අත්ල උඩ දකුණු අත්ල පිහිටුවා සංසුන් ව සිටින ඉරියව්ව හඳුන්වන්නේ.

1. ධ්‍යාන මුද්‍රාව ලෙයසි  2. ධර්ම චක්‍ර මුද්‍රාව ලෙසයි.  3. අභය මුද්‍රව ලෙයසි.

4. භූමි ස්පර්ශ මුද්‍රාව පෙසයි.  5. වරද මුද්‍රාව ලෙයසි.

49. අනුස්මරණිය පුද්ගලයින් වෙනුවෙන් කිසියම් නිර්මාණයක් කොට ඔවුන්ව ගෞරවයට ලක් කිරීම ලෝකයේ බොහෝ රටවල සිදු වේ . එම ක්‍රියාව බෞද්ධ සමාජය මගින් ද දක්නට ඇත්තේ ස්තූප නිර්මාණය මගින්ය. එම නිර්මාණය විවිධ සම්ප්‍රදායන් මගින් නවතාවයකට ලක් ව ඇත. එසේ සංවර්ධනය වු ස්තූපයන්හි **ගර්භයෙන්** ප්‍රකාශිත ආගමික සංකල්පය වන්නේ.

1. සුවාසූ දහසක් ධර්මස්කන්ධයයි.  2. ත්‍රිවිධ රත්නයයි.  3. සත්තිස් බෝධිපාක්ෂික ධර්මයයි.

4. නවාංග ශාස්තෘ ශාසනයයි.  5. දිව්‍ය ලෝකයන් ය.

50. සිංහල සාහිත්‍ය පෝෂණයට බෞද්ධ සංකල්ප වස්තුබීජය වී ඇති අවස්ථා විවිධ ග්‍රන්ථ අධ්‍යයනය මගින් හමුවේ. ඒ නිර්මාණයන් අතරින් ගුත්තිල කාව්‍ය, කාව්‍යශේඛරය, බුදුගුණ අංකාරය, ලෝ වැඩ සඟරාව ඍජු ලෙස බෞද්ධ ආභාෂය ලබා ඇත. එයින් කාව්‍යශේඛරය රචනා කරන ලද්දේ.

1. අනුරාධපුර යුගයේ ය.  2. පොළොන්නරු යුගයේ ය.

3. දඹදෙණි යුගයේ ය.  4. කෝට්ටේ යුගයේ ය.  5. කුරුණෑගල යුගයේ ය.